**බිබිල ප්‍රාදේශීය සභාව**
**මොනරාගල දිස්ත්‍රික්කය**
**-----------------------------**

## 1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 24 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 28 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට බිබිල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 <u>තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම</u>

(අ) <u>**ගිණුම්කරණ අඩුපාඩු**</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ ආයෝජන පොලී ආදායම රු.4,354,363 ක් වැඩියෙන් ගිණුම්ගතකර තිබුණි. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුවේ. | ප්‍රමාද දෝෂයකින් පොලී අඩුවෙන් ගිණුම්ගත වී ඇති අතර 2019 දී ගැලපුම් කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු ආයෝජන පොලී ආදායම රු.107,876 ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුවේ. | කල්පිරෙන දින ගණන අඩුවෙන් දැක්වීම නිසා පොලී ආදායම අඩු වී ඇති අතර 2019 දී නිවැරදි කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේදී මිලදීගෙන තිබුණු රු. 100,950 ක් වටිනා ලී බඩු උපකරණ සහ කාර්යාල උපකරණ ප්‍රාග්ධනිත කර නොතිබුණි. | වත්කම්වල වටිනාකම ප්‍රාග්ධනිත කළ යුතුවේ. | ප්‍රමාද දෝෂයකින් ප්‍රාග්ධනිත කිරීමට නොහැකි වූ අතර 2019 දී නිවැරදි කරමි. |

| | | |
|---|---|---|
| (iv) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් 2019 වර්ෂයේදී දරන ලද රු.29,043 ක් වූ වියදම් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුවේ. | ප්‍රමාද දෝෂයකින් ණයහිමි ප්‍රතිපාදන වෙන් නොකළ අතර 2019 දී නිවැරදි කරමි. |
| (v) සමාලෝචිත වර්ෂය තුලදී දරා තිබුණු රු.48,675 ක් වූ ප්‍රාග්ධන වියදම් අයහාර වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | ප්‍රාග්ධන වියදම අයහාර වියදමක් ලෙස ගිණුම්ගත වීම නිවැරදි කරමි. |
| (vi) වර්ෂය තුල ඉටුකර නොතිබුණු බදුල්ලගම්මන ප්‍රජා ජල ව්‍යාපෘතියට ද්‍රව්‍යාධාර ලබාදීමට යෝජිතව තිබුණු රු. 310,000 ක වටිනාකමක් සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණයහිමි ප්‍රතිපාදන සලසා තිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | ද්‍රව්‍යාධාර ලබාදීමට 2018 ඔක්තෝබර් 23 දින සභාව තීරණය කිරීමත්, 2019 ජනවාරි 07 දින අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබීමත් නිසා ණයහිමි ප්‍රතිපාදන ඇති කරන ලදි. |
| (vii) පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන වැඩසටහන යටතේ මූල්‍ය ප්‍රතිපාදන සලසා තිබුණු නිමිවැඩ වටිනාකම රු. 105,448 ක් වූ බිබිල මල්ලහැව තඹලකැටිය පොදු ළිඳ සංවර්ධනය කිරීමේ කර්මාන්තය, වර්ෂය තුල නිමකර තිබුණද ඒ සඳහා ගිණුම්වල ණයගැති හා ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | ප්‍රමාද දෝෂයකින් ණයගැති ණයහිමි ප්‍රතිපාදන වෙන් කිරීමට නොහැකි වූ අතර 2019 දී නිවැරදි කරමි. |

(ආ) <u>විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම</u>

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| -------------------------- | ------------ | ------------------------------- |
| වටිනාකම රු.128,467,558 ක් වූ ගිණුම් විෂයයන් 06 කට අදාලව කාල විශ්ලේෂණ වාර්තා ඉදිරිපත් නොකිරීම | ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | කාල විශ්ලේෂණ සකස් කරමින් පවතී. |

**1.4** **<u>අනුකූල නොවීම්</u>**
**<u>නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්</u>**

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| **(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත** | | | |
| **(i)** 139 වගන්තිය | වරිපනම් බදු පැනවීමකට යටත් යම් ගෙයක, ගොඩනැගිල්ලක, ඉඩමක හෝ ගෙපතක වාර්ෂික වටිනාකම තක්සේරු කිරීමට හැකිවනු පිණිස වාර වාර්තා කැඳවා නොතිබුණි. | තක්සේරු කිරීමට හැකිවනු පිණිස වාර වාර්තා කැඳවිය යුතුයි. | වාර වාර්තා කැඳවීමට කටයුතු කරමි. |
| (ii) 159 වගන්තිය | සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු රු. 1,092,843 ක හිඟ ආදායම් අයකරගෙන නොතිබුණි. | හිඟ ආදායම් අයකරගත යුතුවේ. | හිඟ ආදායම 2019 දී අයකර ගැනීමට කටයුතු කරමි. |
| (iii) 158,162 හා 163 වගන්ති | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු. 5,160,699 ක හිඟ වරිපනම් බදු අයකරගෙන නොතිබුණි. | හිඟ වරිපනම් බදු අයකරගත යුතුවේ. | හිඟ ආදායම 2019 දී අයකර ගැනීමට කටයුතු කරමි. |
| **(ආ)** 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන අති විශේෂ ගැසට් පත්‍රය | 2014 හා 2015 වර්ෂවල දී අනුමත කර තිබුණු ගොඩනැගිලි සැලසුම් 87 කට අදාල ඉදිකිරීම් පරීක්ෂා කර හෝ අනුකූලතා සහතික නිකුත් කර හෝ නොතිබුණි. | ඉදිකිරීම් භෞතිකව පරීක්ෂාකර ගැසට් පත්‍රයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුවේ. | අනුකූලතා සහතික ලබාගන්නා ලෙසට ලිපි මගින් දැනුවත් කර ඇත. |

**2.** **<u>මූල්‍ය සමාලෝචනය</u>**

**2.1** **<u>මූල්‍ය ප්‍රතිඵල</u>**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 32,267,729 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 32,367,704 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 5,924,975 | 6,412,936 | 4,192,378 | 2,220,558 | 5,592,301 | 6,073,692 | 3,758,308 | 2,315,384 |
| (ii) | කුලී | 12,142,338 | 11,609,839 | 9,262,937 | 2,346,902 | 6,853,200 | 9,863,549 | 3,503,561 | 6,359,988 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 250,000 | 350,220 | 350,220 | - | 150,000 | 150,000 | 144,050 | 5,950 |
| (iv) | වෙනත් ආදායම් | 205,000 | 1,181,148 | 1,181,148 | - | 8,642,999 | 8,642,999 | 15,943,210 | - |
| | එකතුව | 18,522,313 | 19,554,143 | 14,986,683 | 4,567,460 | 21,238,500 | 24,730,240 | 23,349,129 | 8,681,322 |

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ බිල්කරන ලද රු.19,554,143 ක් වූ මුළු ආදායමින් වර්ෂය අවසාන වන විට රු.4,567,460 ක් අයකර නොතිබුණු අතර එය මුළු බිල්කළ ආදායමෙන් සියයට 23 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | පිළිතුරු සපයා නැත. |

**2.2.2 <u>ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය</u>**

**2.2.3 <u>වරිපනම් හා බදු</u>**

| | | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | | -------------------------- | --------------- | ------------------------ |
| (අ) | (i) | සභාව විසින් 1990 වර්ෂයේදී වරිපනම් බදු අය කිරීමට සුදුසු ප්‍රදේශ හඳුනාගෙන තිබුණු අතර, කලින් කළ දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු අයකර ගැනීමට සභාවේ අවධානය යොමුකර නොතිබුණි. | දියුණු කළ ප්‍රදේශ කලින් කළ හඳුනාගෙන වරිපනම් වැඩිකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | වරිපනම් බදු අය කරන බලප්‍රදේශය පුළුල් කිරීමට සහා සම්මතකර විෂයභාර අමාත්‍යවරයාට යොමුකර ඇත. |
| | (ii) | සමාලෝචිත වර්ෂයේ බිල් කරන ලද රු. 3,181,513 ක් වූ වරිපනම් බදු ආදායමින් දෙසැම්බර් 31 දිනට රු. 1,551,256 ක් රැස්කර නොතිබුණු අතර එය මුළු බිල් කළ වටිනාකමින් සියයට 49 ක් විය. | හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කළයුතුවේ. | හිඟ වරිපනම් අයකර ගැනීමට පහත ක්‍රියා මාර්ග ගෙන ඇත.<br>i. කාල විශ්ලේෂණ සකස් කිරීම<br>ii. හිඟ මුදල් අයකර ගැනීමට කමිටුවක් පත් කිරීම.<br>iii. හිඟ අය කර ගැනීමට ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීම.<br>iv. බදු එකතු කිරීමට නිලධාරින් ක්ෂේත්‍රයේ යෙදවීම.<br>v. රු.50,000 ට වැඩි අයගෙන් ප්‍රමුඛස්ථානය දී අයකර ගැනීම<br>vi. එන්තරවාසි නිකුත්කර දේපල තහනමට ගැනීම. |

| | | |
|---|---|---|
| (iii) සමාලෝචිත වර්ෂය ආරම්භයේදී පැවති රු. 4,404,137 ක් වූ හිඟ වරිපනම් බදු ආදායමින් වර්ෂය තුලදී රු. 3,609,444 ක් අයකරගෙන නොතිබුණි. එම අය නොකළ මුදල වර්ෂය ආරම්භයේ පැවති හිඟයෙන් සියයට 82 ක් විය. | හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කළයුතුවේ. | හිඟ වරිපනම් අයකර ගැනීමට පහත ක්‍රියා මාර්ග ගෙන ඇත.<br><br>i. කාල විශ්ලේෂණ සකස් කිරීම<br>ii. හිඟ මුදල් අයකර ගැනීමට කමිටුවක් පත් කිරීම.<br>iii. හිග අය කර ගැනීමට ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීම.<br>iv. බදු එකතු කිරීමට නිලධාරින් ක්ෂේත්‍රයේ යෙදවීම.<br>v. රු.50,000 ට වැඩි අයගෙන් ප්‍රමුඛස්ථානය දී අයකර ගැනීම<br>vi. එන්තරවාසි නිකුත්කර දේපල තහනමට ගැනීම. |

**(ආ) <u>ව්‍යාපාර බදු අයකිරීම</u>**

| | | |
|---|---|---|
| සභා බලප්‍රදේශය තුල පවත්වාගෙන යන ව්‍යාපාර 06 කින් සමාලෝචිත වර්ෂය සඳහා අයවිය යුතු රු. 51,000 ක බදු මුදලක් අයකරගෙන නොතිබුණි. | අයවිය යුතු බදු මුදල් අයකර ගත යුතුවේ. | පිළිතුරු සපයා නැත. |

### 2.2.4 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) <u>හිඟ කඩකාමර කුලී</u>** | | |
| සභාවට අයත් කඩ කාමර 103 කින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු. 3,137,194 ක කුලී අයකර නොතිබුණි. | හිඟ කුලී අයකර ගත යුතුවේ. | 2019 අප්‍රේල් 30 දිනට හිඟය රු.1,742,994 ක් වේ. |

**(ආ) හිඟ දේපල බදු ආදායම්**

| | | |
|---|---|---|
| සභාවට අයත් දේපල 8 කින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.1,092,843 ක බදු මුදල් අයකරගෙන නොතිබුණි. | හිඟ බදු මුදල් අයකර ගත යුතුවේ. | 2019 අප්‍රේල් 30 දිනට හිඟය රු. 241,871 ක් වේ. |

**2.2.5 ජල ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂ 1කට අධික කාලයක සිට අයනොවී පවතින රු. 915,806 ක් වූ හිඟ ජල ගාස්තු සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනවන විටද අයකර නොතිබුණි. | හිඟ ජල ගාස්තු අයකර ගත යුතුවේ. | 2019 අප්‍රේල් 30 දිනට හිඟය රු.358,367 ක් වේ. |

**2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවති හිඟ උසාවි දඩ රු. 1,341,277 ක් හා හිඟ මුද්දර ගාස්තුව රු. 3,291,590 ක් අයකර නොතිබුණි. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකර ගත යුතුවේ. | 2019 අප්‍රේල් 30 දිනට හිඟ උසාවි දඩ මුදල රු.545,831 ක් සහ හිඟ මුද්දර ගාස්තුව රු.1,650,741 ක් වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන්, ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) <u>අතුරු ව්‍යවස්ථා</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු වුවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිටත් ඉන් කාරණා 06 ක් සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා නොමැති කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුවේ. | මෙතෙක් පනවා නොමැති අතුරු ව්‍යවස්ථා ඉදිරියේදී පැනවීමට කටයුතු කරමි. |

(ආ) <u>තිරසර සංවර්ධන ඉලක්ක</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව එක්සත් ජාතින්ගේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව දැනුවත්වී තිබුණද, සභාවට අදාල කරගත හැකිවන පරිදි හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟාකර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක පැහැදිලිව හඳුනා ගෙන හා ඒවා මැනීම සඳහා දර්ශකද හඳුනා ගෙන ඉදිරියේදී කටයුතු කරමි. |

**3.2** <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ)** <u>මුදල් ප්‍රතිපූර්ණය කර නොගැනීම</u> | | |
| පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමේ පදනම මත, කොටගම මහජන පුස්තකාලයට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ දී රු. 50,000 ක් සභා අරමුදලින් වැය කර තිබුණි. එහෙත් එම මුදල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනවන විටද ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි. | මෙම මුදල ප්‍රතිපූර්ණය කරගත යුතුවේ. | රු. 50,000 ක මුදල ප්‍රතිපූර්ණය කර ගැනීමට ලිපි යොමු කරමි. |

**(ආ)** <u>පාරිසරික ආරක්ෂණ බලපත්‍ර</u>

| | | |
|---|---|---|
| සභා බලප්‍රදේශය තුල පවත්වාගෙන යන පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාර 36 ක් සඳහා අදාල කටයුතු කර පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාදී නොතිබුණි. | මෙම ව්‍යාපාර පරීක්ෂාකර නියමිත ගාස්තු අයකර පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාදිය යුතුවේ. | බලපත්‍ර ලබාගත යුතු අයට ලබා ගන්නා ලෙස දැනුවත්කර ඇති අතර ලබා නොගන්නා අයට විරුද්ධව නීති මගින් කටයුතු කරමි. |

**(ඇ)** <u>ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල්,ආපනශාලා හෝ නවාතැන්පොළවල් සඳහා බදු පැනවීම</u>

| | | |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147(i) හා 149 වගන්ති ප්‍රකාරව ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති හෝ එම මණ්ඩලය අනුමතකර ඇති ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ පිහිටි හෝටල් හෝ නවාතැන් පොළවලින් ආදායම් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි. | අදාල ආයතන වලින් නියමිත ගාස්තු අය කර ගත යුතුවේ. | අදාල ආයතනවලින් 1% බදු අයකර ගැනීමට විස්තර සංචාරක මණ්ඩලය වෙතින් ලබා ගැනීමට කටයුතු කර ඇති අතර, එම විස්තර ලද පසු මුදල් අයකර ගනිමි. |

## 3.3 <u>මානව සම්පත් කළමනාකරණය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| --------------------------- | -------------- | ---------------------------- |
| <u>**කාර්ය මණ්ඩල පුරප්පාඩු**</u> | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය අනුව සභාවේ තනතුරු 07 කට අදාලව පැවති සේවක පුරප්පාඩු 11 ක් පුරවා නොතිබුණි. | කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පුරවා ගත යුතුවේ. | පළාත්පාලන කොමසාරිස්ගෙන් අනුමැතිය ලද පසු පුරප්පාඩු සම්පූර්ණ කරමි. |

## 3.4 <u>වත්කම් කළමනාකරණය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| --------------------------- | ------------- | -------------------- |
| සභාවට අයත් අක්කර 21 පර්චස් 37.15 ක් වූ ඉඩම් කැබැලි 30 ක් විධිමත්ව තක්සේරු කර නොතිබුණු | සභාවලට අයත් ඉඩම්වල නීත්‍යානුකූල | ඉදිරියේදී දේපළ තක්සේරු කර |

| | | |
|---|---|---|
| අතර, ඉඩම් අක්කර 08 රූඩ් 01 පර්චස් 31.11 ක් වූ ඉඩම් කැබැලි 07 ක නීත්‍යානුකූල අයිතිය සභාවට පවරාගෙන නොතිබුණි. | අයිතිය පවරාගත යුතුවේ. | අයිතිය පවරා ගැනීමට පියවර ගනිමි. |

## 3.5 වාහන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්ගේ 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය අනුව සභාවට අයත් වාහන 05 ක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. | චක්‍රලේඛයේ උපදෙස් පරිදි ඉන්ධන දහනය පරීක්ෂා කළ යුතුවේ. | 2019 වර්ෂයේදී සභාව සතු සියළු වාහනවල ඉන්ධන දහනය පරීක්ෂාව සිදු කරමි. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙලකර තිබුණු අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තු කළ ආදායම් හා වියදම්, වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 8 ක සියයට 10 සිට සියයට 100 දක්වාද වියදම් විෂයයන් 5 සියයට 11 සිට සියයට 75 දක්වාද විචලනයන් පැවතුණි. | නිවැරදි අයවැය ලේඛනයක් පිළියෙල කර එහි දක්වා ඇති ඉලක්ක සපුරාගත යුතුවේ. | පිළිතුරු සපයා නොමැත. |

## 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අභ්‍යන්තර විගණන කටයුතු සඳහා නිලධාරියෙකු පත්කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන කටයුතු සඳහා නිලධාරියෙකු පත්කළ යුතුවේ. | 2019 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත්කර ඇත. |

## 4.3 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2009 ජුනි 9 දිනැති චක්‍රලේඛ අංක ඩීඑම්ඒ/ 2009 (01) දරන අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ පිළිබඳ චක්‍රලේඛය අනුව සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවා නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවිය යුතුවේ. | දැනට විගණන හා කළමනාකරණ කමිටුවක් පත්කර ඇත. |